fpa
SRI LANKA
enriching relationships

# පුවත් සංග්‍රහය

2011 දෙවන කලාපය

www.fpasrilanka.org

**සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDG) - 5b ජය ගැනීම...**




විශේෂිතවූ හැකියා සහිත පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා නොමිලේ පැවැත්වූ වෛද්‍ය සායනයකට සහභාගීවූ සුන්දර පවුලක්

# පහසුවෙන් සේවා ලබා ගැනීමට FPA සුව සේවා මධ්‍යස්ථාන 5ක්

**ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ කොළඹ, අම්පාර, මඩකලපුව, කොග්ගල සහ නුවරඑළිය මධ්‍යස්ථාන FPA සුව සේවා මධ්‍යස්ථාන ලෙස දැන් ක්‍රියාත්මක වේ.**

මෙම සුව සේවා මධ්‍යස්ථාන මගින් සියලුම පවුල් සැලසුම් සේවාවන් නොමිලේ ලබාගත හැක.

ඊට අමතරව ගැබ්ගෙල පිළිකා හඳුනාගැනීම සඳහා පැප්ස්මියර් පරීක්ෂාව, පියයුරු පිළිකා පරීක්ෂාව, උපදේශන සේවා, රුධිර හිමොග්ලොබීන් පරීක්ෂාව, සීනි සඳහා පරීක්ෂාව ආදිය සිදු කරගත හැකිය.

සෑම මධ්‍යස්ථානයකම සතියකට දින 2ක් මෙම වෛද්‍ය සේවා ලබා දීම සඳහා වෙන්කර තිබේ.

වැඩිදුර විස්තර පහත දුරකථන අංක ඇමතීමෙන් ඔබට ලබාගත හැකිය.

| | |
|---|---|
| අම්පාර | 063 3638483 |
| මඩකලපුව | 065 2226163 |
| කොග්ගල | 011 3159258 |
| නුවරඑළිය | 052 4925024 |
| කොළඹ | 077 1050984 |




සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට මගපෙන්වන "අරුණැල්ල" අධ්‍යාපනික ජංගම ප්‍රදර්ශනය නරඹන පාසල් සිසුවියන්...

## කොළඹ මහ නගර සභා සීමාව තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනයට සැලැස්මක්

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ කොළඹ FPA සුව සේවා මධ්‍යස්ථානය, කොළඹ මහ නගර සභා සීමාව තුළ සිටින සෞඛ්‍ය උපදේශකවරුන්, උපදේශකවරියන් සහ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන් සඳහා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දෙදින වැඩමුළුවක් පවත්වන ලදි. මෙම වැඩමුළුව අවසානයේදී කොළඹ මහ නගර සීමාව තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනයට සැලැස්මක් සකස් කිරීමට පියවර ගනු ලැබීය.

05 පිටුවට......



# ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිතයින් 7 දෙනෙකු ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතිවාසිකම් පිළිබඳ දකුණු ආසියානු කලාපීය සමුළුවට




ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පස්දෙනෙක් හා මන්ත්‍රීවරියන් දෙදෙනෙක් පසුගිය මැයි මාසයේ තායිලන්තයේ **චියැන්ග් මායි** නුවර පැවති ප්‍රජනක සෞඛ්‍යය සහ අයිතිවාසිකම් පිළිබඳ දකුණු ආසියානු කලාපීය පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ වැඩමුළුවට සහභාගී වූහ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ජේයරත්නම් ශ්‍රී රංගා, රුවන් රණතුංග, ඒ. එච්. චම්පික බුද්ධදාස, වසන්ත සේනානායක සහ හරින් ප්‍රනාන්දු යන මහත්වරුන් ද, මන්ත්‍රීවරියන් වන රෝසි සේනානායක මහත්මිය සහ උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය මෙම පිරිසට අයත් වූහ.



සමුළුවට සහභාගීවීමට පෙර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී පැවති හමුවකදී ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා ආගුස් මහත්මිය අදහස් දක්වමින්...



ඡායාරූපයේ වමේ සිට: නියෝජ්‍ය අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා, ආචාර්ය ඒ. ටී. පී. එල්. අබේකෝන් මහතා, ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය ලොෂාන් මුණසිංහ මහතා, අධ්‍යාපන ඒකකයේ අධ්‍යක්ෂිකා මදුෂා දිසානායක මහත්මිය, පාර්ලිමේන්තු මන්ත්‍රිනී රෝසි සේනානයක මහත්මිය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන වසන්ත සේනානායක මහතා, ජේ. ශ්‍රී රංගා මහතා සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ සහකාර ශ්‍රී ලංකා නියෝජිත ගාමිණි වනසේකර මහතා

සමුළුවට සහභාගීවීමෙන් පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් වන රෝසි සේනානයක මහත්මිය සහ උපේක්ෂා ස්වර්ණමාලී මහත්මියත් පාර්ලිමේන්තු මන්ත්‍රී රුවන් රණතුංග මහතාත් පවුල් සංවිධාන සංගමයේ දී වැඩසටහනකට සහභාගි වෙමින්...

## ගජබා රෙජිමේන්තුවට පොත් පරිත්‍යාග කිරීම




රණවිරුවන්ගේ දරුවන් වෙනුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ ගජබා රෙජිමේන්තුව අනුරාධපුරයේ ඉදිකරන පුස්තකාලය සඳහා, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් එකතු කරගත් පොත්-පත් තොගයක් ගජබා රෙජිමේන්තුවේ කපිතාන් ඩබ් කේ. පී. බී. අඹුවන්ගල මහතා වෙත බාරදුන් මොහොත.

## නුවරඑළිය මධ්‍යස්ථානය විවෘත කරමින්...



නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අමාත්‍ය සී. බී. රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් FPA නුවරඑළිය මධ්‍යස්ථානය විවෘත කරන ලදි. එහි කළමණාකාර පී. දයාරත්න මහතා සභාව ඇමතූ අවස්ථාව.

# තරුණයින් සඳහා සෞඛ්‍ය ප්‍රතිපත්තිය, රටේ අනාගතයට ඉතා වැදගත් වන්නකි.



තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සෞඛ්‍ය ප්‍රතිපත්තියක් මේ වනවිට සැකසෙමින් පවතී. එවැනි ප්‍රතිපත්තියක අවශ්‍යතාව සහ එහි මූලිකාංග පිළිබඳව, යොවුන් සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ජාතික උපදේශක **වෛද්‍ය හරිස්චන්ද්‍ර යකන්දාවල** මහතා සමඟ කරන ලද සාකච්ඡාවක් ඇසුරෙන් මෙම ලිපිය සකස් කරන ලදි.

තරුණයින් සඳහාවු සෞඛ්‍ය ප්‍රතිපත්තිය සකස් කරන්නේ අවුරුදු 10-24 අතර වයසේ පසුවන කණ්ඩායමටයි. ලංකාවේ මුළු ජනගහනයෙන් 28%ක් පමණ මෙම කොටසට අයත්වෙනවා. එය රටක සැලකිය යුතු ප්‍රමාණයක්; මුළු ජනගහනයෙන් 1/3කට ආසන්න පිරිසක්. මෙම පිරිස රටේ ඊළඟ පරම්පරාව; රටේ අනාගතය බාරගන්නා පිරිසයි. මේ අයගේ සෞඛ්‍ය ප්‍රධාන අංගයක් විය යුතුයි. එයට අවශ්‍ය පසුබිම සකස්කර දිය යුතුයි.

පාසල් දරුවන් දෙස බලනවිට අවුරුදු 10-11 පමණ වනතෙක් ඔවුන්ගේ සෞඛ්‍ය සඳහා යමක් පාසල් පද්ධතිය තුළ සිදුවනවා. විවාහ වුන කෙනෙක් සැලකුවහොත් ඊට පසුව මාතෘ හා ළමා සෞඛ්‍ය පද්ධතියට අයත්වෙනවා. තරුණ පිරිසට එවන්නක් නැහැ.

මෙවැනි ප්‍රතිපත්තියක් ඇතිවිට රටේ තරුණ පිරිසට බලපාන විශේෂිත කරුණු හඳුනාගැනීමට හැකිය. තරුණයින්ගේ තිබෙන ගැටලු අප හඳුනාගෙන, අපට ඒවාට පිළිතුරක් දීමට ඒ සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රය කෙසේ සූදානම් විය යුතුද යන්න සෞඛ්‍ය ප්‍රතිපත්තියෙන් හඳුනාගෙන තිබෙනවා.

තරුණයින් සඳහා වන සෞඛ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වන්නේ 2004-2005 වසරවල දී පමණය. මෙය ආරම්භයේදි ලංකාවේ සියලු ප්‍රදේශවලින් විවිධ තරුණ කණ්ඩායම් ගෙනවිත් ඔවුන්ගේ කරුණු විමසීමක් සිදුකළා.

මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමට අවශ්‍ය මූලික තොරතුරු එකතුකර ගැනීම, ගැටලු හඳුනාගැනීම එහිදී සිදුවුනා. එමෙන්ම 2004 දී UNICEF ආයතනයත් සමඟ සිදුකළ සමීක්ෂණය මෙයට ප්‍රයෝජනවත් කරගත්තා.

මෙම තරුණ ප්‍රතිපත්තියේ ප්‍රධාන තේමාවල් 5 ක් පවතී.

**මනෝ සමාජීය සංවර්ධනය සහ මානසික ගැටලු**

තරුණ පිරිසට බලපාන මනෝ සමාජීය සහ මානසික ගැටළු සාකච්ජා කිරීම ඉතා වැදගත්.

**පෝෂණය**

ඌනතා වර්ධනය මෙන්ම අධිපෝෂණයත් අද බොහෝවිට දැකිය හැකි තත්ත්වයකි. බොහෝ ළමුන්ගේ ඇති ආහාර ගැනීමේ පුරුදු මෙයට බලපා තිබෙනවා. මේ වනවිට බෝ නොවන රෝගවලට විශාල පිරිසක් ගොදුරු වෙමින් පවතිනවා. මෙවැනි රෝගවලට මූලික වන්නේ මෙම වයසේ ඇතිකරගන්නා ආහාර පුරුදු, ආහාර, ජීවන රටාවන්. "Life cycle approch" යටතේ ඔවුන්ගේ ජීවිතවලට මේ කාලයේ බලපෑමක් කළ හැකිනම් ඉදිරියේදී බෝ නොවන රෝගවලට ගොදුරුවීමේ අවදානම බොහෝ දුරට අඩුකර ගත හැකි වෙනවා.

**ගැටුම්, අනතුරු සහ සියදිවි නසා ගැසීම්**

බොහෝ විට තරුණ පිරිස් විවිධ හේතු නිනසා ආබාධිත තත්ත්වයට හෝ අනතුරුවලට හෝ එවැනි අවදානම්වලට ලක්වනවා. අපට හැකිනම් එවැනි තත්ත්ව වලින් ඔවුන් වළක්වා ගැනීමට එය වැදගත් වෙනවා. විවිධ යන්ත්‍ර, යතුරු පැදි, ජලය වැනි දෑ මඟින් සිදුවන හානිදයක තත්ත්ව වළක්වා ගැනීමට ක්‍රියාමාර්ගයන් ගත හැකිය.

**මත්ද්‍රව්‍ය මධ්‍යසාර**

තරුණ වයසේදී පහසුවෙන් මත්ද්‍රව්‍ය, මද්‍යසාර, සිගරැට් වැනි දේවලට ගොදුරුවිය හැකිය. මෙයත් බෝ නොවන රෝගවලට මෙන්ම අනෙකුත් බොහෝ දේවලට බලපායි.

## ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ මාධ්‍ය අවධානය

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ශ්‍රවනාගාරයේදී ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවධානය යොමුවීම පිළිබඳ සාකච්ඡා කිරීමට පැවති මාධ්‍ය හමුවේ අවස්ථා කිහිපයකි.



ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය ලක්ෂ්මන් සේනානායක මහතා



ප්‍රජා වෛද්‍ය විශේෂඥ වෛද්‍ය ලොෂාන් මුණසිංහ මහතා



විශේෂඥ වෛද්‍ය හරිස්චන්ද්‍ර යකන්දාවල මහතා



විශේෂඥ වෛද්‍ය නිමල් එදිරිසිංහ මහතා



සහභාගීවූ මාධ්‍යවේදීන් පිරිසක්





මෙම ආරම්භක අවස්ථාවේ ක්‍රියාත්මක වීමෙන් Primary Prevention මෙම අවදානම අඩුකර ගත හැකිය.

**ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යය**

ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යය සම්බන්ධව ඇති අයිතීන්, සේවාවන්, දැනුම සහ කුසලතා සංවර්ධයට මෙය හේතුකරගත හැකිය.

මෙම තේමා 5 සෞඛ්‍ය ප්‍රතිපත්තිය සැකසීමේදී අවදනයට යොමු කරන ලදි.

මෙම මොහොත වනවිට අත් පිටපත සකස්කර නිමාවී තිබෙනවා. ඉදිරියේදී අපට මෙය සෞඛ්‍ය අමාත්‍යාංශයට බාරදීමට හැකියාව තිබෙනවා. නමුත් මම හිතනවා මෙය තවදුරටත් සාකච්ඡාවට ලක්විය යුතුයි කියා.

මෙවැනි ප්‍රතිපත්තීන් සකස් කළ පසු එයට ක්‍රියාකාරී සැලැස්මක් එක්විය යුතුයි. එක් එක් ආයතන, රජයේ ආයතන, රාජ්‍ය නොවන ආයතන, එක්සත් ජාතීන්ගේ සංවිධානය ආදී මේ සම්බන්ධව කටයුතු කරන ආයතනවලට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ගත හැකිය.

මෙය එවැනි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට මගපෙන්වන ලියවිල්ලක් වෙයි.

මේ සඳහා කවරෙකු හෝ මූලික විය යුතුයි. මොනවද, කවුරුද, කවදද කරන්නේ කියන දෙය අප හඳුනා ගත යුතුයි. ඉන් පසුව අප එයට අවශ්‍ය සම්පත් මොනවාද කියා සොයා බැලිය යුතුයි. ඒ අතරම මූල්‍ය සැලැස්මක් සකස්විය යුතුයි. ක්‍රියාකාරී සැලැස්ම අවු.2කට, අවු.5කට, අවු. 10කට ආදී වශයෙන් සකස් කළ හැකිය. මා හිතනවා මේ මොහොතේ අපි අවු. 5ක පමණ කාලයක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ගැනීම සුදුසුයි. මා විශ්වාස කරනවා රජය මේ සඳහා මූලික බරක් දැරිය යුතු බව. පිටරටින් මෙවැනි දෙයකට මුදලක් එනතෙක් බලා නොසිට මෙය රටේ අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන කටයුතු කළ යුතුයි.

සෞඛ්‍ය ප්‍රතිපත්තිය සකස් කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශය මුල් වූ අතර එයට එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA), ශ්‍රී ලංකා පවුල් සංවිධානය සංගමය සහය ලබාදුන්නා.

## මඩකලපුව පොලිස් මූලස්ථානයේදී උපදේශන වැඩ සටහනක්

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය, මඩකලපුව පොලිස් ස්ථානයේ නිලධාරීන් සඳහා ප්‍රජනක සෞඛ්‍ය හා පවුල් ජීවිතය පිළිබඳව දැනුවත් කිරීමේ උපදේශන වැඩසටහනක් පවත්වන ලදි. මඩකලපුව පොලිස් මුලස්ථානයට අනුයුක්ත කාන්තා හා ළමා අංශයේ පොලිස් නිලධාරීන් විශේෂයෙන්ම මෙම වැඩසටහනට සහභාගී වූහ.

## සිලෝන් බිස්කට් සමාගමේදී...



ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ වෛද්‍ය අධ්‍යක්ෂිකා සුමිත්‍රා තිසේරා මහත්මිය සිලෝන් බිස්කට් සමාගමේ සේවිකාවන් පිරිසක් ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කරමින්...

## දිගාමඩුල්ලේ ජනතාව ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දැනුවත් වෙයි



අම්පාර නගර සභා භූමියේ පැවැති ප්‍රදර්ශනයකදී FPA පදර්ශන කුටියට පැමිණි ෆේරියල් අෂ්රෆ් ඇමතිතුමිය පැමිණි මොහොත.

## කොග්ගල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ සිසු සිසුවියන් ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දැනුවත් වෙයි



කොග්ගල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ සිසු සිසුවියන් සඳහා සංවිධානය කරන ලද ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ වැඩසටහනකදී සහකාර අධ්‍යක්ෂ නිහාල් නානායක්කාර මහතා පැමිණ සිටි පිරිස දැනුවත් කරමින් ...

## ජඩෙල් වැඩමුළුව

කාන්තාවන් සඳහා දිගු කලීන පවුල් සැලසුම් ක්‍රමයක් ලෙස හඳුන්වාදෙනු ලබන ජඩෙල් තැන්පතු පිළිබඳ වෛද්‍යවරු සඳහා වැඩමුළුවක් කඩුගන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේදී පැවැත්වූ අවස්ථාව. වෛද්‍යවරුන් හා වෛද්‍යවරියන් තිස්දෙනෙකු පමණ මෙම අවස්ථාවට සහභාගී වූහ.



... 1 පිටුවෙන්

## කොළඹ මහ නගර සභා සීමාව තුළ . . .



වැඩමුළුව අවසානයේ පැවැති සාකච්ඡාවට සහභාගි වූ පිරිස වමේ සිට: සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශයේ කැළුම් ගමගේ මහතා, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා, කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෛද්‍ය ප්‍රදීප් කාරියවසම් මහතා, පවුල් සංවිධාන සංගමයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර් වී පී රාජපක්ෂ මහතා, සහකාර අධ්‍යක්ෂ නිහාල් නානායක්කාර මහතා සහ යොවුන් මිතුරු මධ්‍යස්ථානයේ කළමණාකාරිනී උදේශිකා ලුම්බිණී මෙනවිය ඇතුළු පිරිස.

වැඩමුළුවට සහභාගි වූ පිරිස සඳහා ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපනය තරුණ තරුණියන්ට ලබාදීමේ වැදගත්කම, නූතන පවුල් සැලසුම් ක්‍රම, එච් අයි වී / ඒඩ්ස්, ලිංගාශ්‍රිතව බෝවන රෝග, උපදේශනය ආදි ක්ෂේත්‍ර පිළිබඳව දැනුවත් කිරීම සිදුවිය.

## ජ්‍යෙෂ්ඨ බාලදක්ෂිකාවන් සඳහා වැඩසටහන්
### බදුල්ල දිස්ත්‍රික් වැඩසටහන් ආරම්භ වේ.



2011 වර්ෂයේ බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනේ ක්‍රියාකාරී එක් අවස්ථාවක්

බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා බාලදක්ෂිකා මූලස්ථානය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරයි. 2011 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් 4 ක බාලදක්ෂිකාවන් 41 දෙනෙක් සහ බාලදක්ෂිකා නායිකාවන් ලෙස පුහුණුව ලත් ගුරු මහත්මීන් ද පුහුණුවට සහභාගි වූහ. මෙම පුහුණුව බදුල්ල පැල්ගහතැන්න, ඌව කළමණාමනාකරණ සංවර්ධන මධ්‍යස්ථානයේ දී නේවාසික වැඩසටහනක් ලෙස පවත්වන ලදි.

## ගංගොඩවිල මෙත් සෙවනේ රැඳවියන් සඳහා ජංගම වෛද්‍ය සායනයක්...





විවිධ හේතු මත උසාවි නියෝගයෙන් කාන්තාවන් රඳවා තබා ඇති ගංගොඩවිල මෙත් සෙවනේ කාන්තාවන් සඳහා සුව නාරි වෛද්‍ය සායනයක් පවත්වන ලදී. එහි අධිකාරී ජේ. දිසානායක මහතා වෛද්‍ය සායනයෙන් පසුව පැමිණ සිටි පිරිස ඇමතූ අවස්ථාව. රැඳවියන් සඳහා එදිනෙදා අවශ්‍ය ද්‍රව්‍ය ආධාර බෙදා දීමක්ද මෙහිදී සිදුවිය. අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය සහ මහේෂ් කුමාර මහතා ආධාර බෙදාදුන් අවස්ථාව.

**ආලෝකය උපදේශන මධ්‍යස්ථානය**
**011 2 555 455**

## ජාතික තරුණ සේවා සභාව සමඟ විශේෂිත හැකියා සහිත පුද්ගලයින් සඳහා වැඩසටහන්



පවුල් සංවිධාන සංගමය, ජාතික තරුණ සේවා සභාව සමඟ එක්ව විශේෂිත හැකියා සහිත පුද්ගලයින් සඳහා, ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ආරම්භ කර ඇත.

මේ යටතේ හොරණ පිහිටි "සුබිත " විශේෂිත හැකියා සහිත පුද්ගලයින් සඳහා එම මධ්‍යස්ථානයේදී සහ සීදූවේ පිහිටි විශේෂිත හැකියා සහිත පුද්ගලයින්ගේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේදී වැඩසටහන් 2ක් පවත්වන ලදි.

# පුවත් සංග්‍රහය

FPA SRI LANKA
enriching relationships

ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට

අමතන්න **2 588 488**

පිවිසෙන්න **www.happylife.lk**

SMS කරන්න **071 6 408 408**


www.fpasrilanka.org

37/27, බුලර්ස් පටුමග, කොළඹ 07.
දුරකථන: 011 2 555 455 ෆැක්ස්: 011 2 55 66 11
ඊ මේල්: fpa@fpasrilanka.org





## ලීසා ව්‍යාපෘතිය (LISA Project)

උතුරු-නැගෙනහිර යුධ වාතාවරණය නිමාවීමෙන් පසු නැවත පුද්ගලයින් පදිංචි කරන ලද ප්‍රදේශවල, ගර්භනී මව්වරුන්ට සෞඛ්‍යාරක්ෂාව සඳහා දරු ප්‍රසූතියේදී අවශ්‍ය කෙරෙන ද්‍රව්‍ය සහිත කට්ටල සහ සනීපාරක්ෂක කට්ටල බෙදාදීම, උපදේශන සේවා සහ ජංගම වෛද්‍ය සායන පැවැත්වීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) මූල්‍යාධාර ලබාදෙන මෙම ව්‍යාපෘතිය සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ මඟ පෙන්වීම යටතේ සිදුවන අතර සම්බන්ධීකරණය සහ වැඩසටහන් සංවිධානය කිරීම ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය මඟින් සිදු කරනු ලබයි.



**මෙතෙක් වව්නියාවේ පිහිටා තිබූ ලීසා සම්බන්ධීකරණ කාර්යාලය කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කවල නැවත පදිංචි කළ ජනතාවට වඩා පහසුවෙන් සේවා ලබාදීම සඳහා මාන්කුලමේදී විවෘත කරන ලද අවස්ථාව එකසත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) ශ්‍රී ලංකා නියොජිත ලෙනේ ක්‍රිස්ටියන් සෙන් මහත්මිය පැමිණ සිටි පිරිස අමතමින්**



**දකුණු ආසියානු කලාපීය පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ කණ්ඩායමක් LiSa ව්‍යාපෘතියේ කටයුතු නිරීක්ෂණයට පැමිණි අවස්ථාව**

මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි නැවත පදිංචි කළ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහන එම දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේ පූර්ණ අධීක්ෂණය සහ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීවරුන්ගේත් එම කාර්ය මණ්ඩලයන්ගේත් පූර්ණ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වේ.



**දකුණු ආසියානු කලාපීය පාර්ලිමේන්තු නියෝජිතයෙක් ගර්භනී මවකට ද්‍රව්‍ය ආධාර කට්ටලයක් ලබාදුන් අවස්ථාව. පවුල් සංවිධාන සංගමයේ නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්. වී. පී. රාජපක්ෂ මහතා ද ඡායාරූපයේ වේ.**

## ගජබා සුපර් ක්‍රොස් සඳහා ස්ටැමිනා අනුග්‍රහය






